තනතුරු - ඇබෑර්තු

උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය

**<u>උතුරු මැද පළාතේ පුරප්පාඩු වී ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තනතුරු (කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ) සඳහා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියේ විදුහල්පතිවරුන් රාජකාරී ආවරණය සඳහා පත්කිරීම.</u>**

උතුරු මැද පළාතේ පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තනතුරු(කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ) සඳහා විධිමත් පරිදි ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් පත්කරන තෙක් එම තනතුරුවල රාජකාරී ආවරණය සඳහා උතුරු මැද පළාතේ සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියේ විදුහල්පතිවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සුදුසුකම්:

I. 2024.01.01 දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියේ සක්‍රිය හා සතුටුදායක වසර 05ක සේවා කාලයක් තිබිය යුතුය.

II. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2024.01.30 දිනට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියේ තනතුරට නියමිත සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු යි. වාර්ෂික වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබිය යුතු අතර, සතුටුදායක හෝ ඉන් ඉහළ කාර්යසාධන මට්ටමක් අත්කරගෙන තිබිය යුතුය.

III. අයදුම්කරුවන් උතුරු මැද පළාත් සභාවේ සේවයේ නියුතු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 1 ශ්‍රේණියේ විය යුතුය.

IV. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න පස් වසරක කාල සීමාවක් තුළ දෝෂදර්ශනයට, විගණන විමසුමකට, විනය කටයුත්තකට හෝ විනය දඬුවමකට භාජනය නොවූ අයෙකු විය යුතු ය.

V. 2024.01.01 දිනට වයස අවුරුදු 57 නොඉක්මවා තිබිය යුතුය.

02. තෝරා ගැනීමේ ක්‍රමය:

❖ උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සහ ඉදිරිපත් කිරීමේදී ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

(අනුමත ලකුණු පටිපාටිය හා පුරප්පාඩු පවතින ලැයිස්තුව www.cm.nc.gov.lk හා www.edncp.lkයන වෙබ් අඩවිවල පළ කර ඇත.)

සටහන: සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් , ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

03. අයදුම්පත් ඉදිරිපත් කිරීම:

සියලුම අයදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර 2024.01.30 වැනි දින හෝ ඊට පෙර ලැබෙන ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව "ලේකම්,

අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය, 5 වන මහල, උතුරු මැද පළාත, අනුරාධපුර" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ "උතුරු මැද පළාතේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තනතුරක් වන කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ(රාජකාරී ආවරණය) තනතුර සඳහා අයදුම්පත් කැඳවීම" යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් භාර ගනු නොලැබේ. (ආදර්ශ අයදුම්පත්‍රය www.cm.nc.gov.lk හා www.edncp.lk යන වෙබ් අඩවි වලින් බාගත කර ගත හැකි ය)

06.අදාළ සුදුසුකම් සහිත අයදුම්කරුවන් ඉදිරිපත් නොවූ අවස්ථාවක ගන්නා ක්‍රියාමාර්ග.

1. යම් කොට්ඨාසයක් සඳහා කිසිදු අයදුම්කරුවෙකු ඉදිරිපත් නොවන අවස්ථාවක දී කාර්ය සාධනය සැලකිල්ලට ගෙන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය මත පළාත් අධ්‍යාපන ලේකම් විසින් සුදුසු අයෙකු ස්ථාන ගත කරනු ලැබේ.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් සතුවේ.

එච්.පී.පී. අභයලක්ෂ්මී හේවාපතිරණ
ලේකම්,
ප්‍රධාන අමාත්‍යාංශය,
උතුරු මැද පළාත.

එච්.පී.පී. අභයලක්ෂ්මී හේවාපතිරණ
ලේකම්
ප්‍රධාන අමාත්‍යාංශය
උතුරු මැද පළාත.

2024 ජනවාරි මස 09 වැනි දින,

උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයදී ය.